දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2015 ප්‍රථම වර පරීක්ෂණය - 2018 ජූලි/අගෝස්තු
Bachelor of Arts General (External) Degree Part II Regular Examination 2015 – July/August 2018

# භූවිසා 3.2 - ප්‍රාදේශීය භූගෝල විද්‍යාව
# GYG 3.2 - Regional Geography

කාලය පැය තුන යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
නො පැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු විය හැකි ය

---

## 01 වන කොටස

01. (i) ප්‍රාදේශීය භූගෝල විද්‍යාව යනු කුමක් ද?

(ලකුණු 08)

(ii) භූගෝල විද්‍යා විෂය තුළ ප්‍රාදේශීය භූගෝල විද්‍යාවේ සංවර්ධනය සහ විකාශනය සිදුව ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

02. 'ගෝලීයකරණය' යනු කුමක්දැයි හඳුන්වා දී, 'සංස්කෘතික ගෝලීයකරණය' ප්‍රාදේශීය අනන්‍යතාවන් කෙරෙහි බලපාන ආකාරය නිශ්චිත නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

03. "ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීම කෙරෙහි ඉහළ විභවතාවක් සහිත මූලාශ්‍රයක් වුවත් ඇතැම් මානව කටයුතු එම විභවතාව හීන කරමින් තිබේ." ඉහත ප්‍රකාශය නිශ්චිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 20)

04. (i) විකල්ප සංචාරක ප්‍රභේද යනු මොනවාදැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් ලෙස පාරිසරික සංචරණයේ ඇති විභවතාව නිශ්චිත නිදසුන් සහිතව විවේචනාත්මකව විග්‍රහ කරන්න.

(ලකුණු 12)

## 02 වන කොටස

05. ශ්‍රී ලංකාවේ පලාත් අතර ඇති සංවර්ධන විෂමතා

* කෘෂිකර්මාන්ත
* කර්මාන්ත
* සේවා

යටතේ සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

06. (i) මානව සංවර්ධන දර්ශකය (Human Development Index) ගණනය කරන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(ii) මානව සංවර්ධන දර්ශකය තරා කිරීමේ දී ශ්‍රී ලංකාවේ තත්වය අනිකුත් දකුණු ආසියාතික රටවල් සමග සංසන්දනය කොට විග්‍රහ කරන්න.

(ලකුණු 08)

07. පලාත් පාලන ආයතන (Local Authorities) යනු මොනවාදැයි හඳුන්වා එහි කාර්යභාරය පලාත් සංවර්ධනයේ දී වැදගත්වන අයුරු විස්තර කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් ආයතන මගින් හඳුන්වා දී ඇති භෞතික/සංවර්ධන සැලසුම් මොනවාදැයි වෙන වෙනම පහදන්න.

i. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPPD)
ii. පලාත් සභාව (Provincial Council)
iii. නාගරික සංවර්ධන අධිකාරිය (UDA)
iv. මහවැලි සංවර්ධන අධිකාරිය

(ලකුණු 5x4 = 20)